මගේ අංකය :- JSC/SEC/CIR/2024

**සියලුම අධිකරණ නිලධාරීන් වෙත,**

**කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්ගේ අංක පුනකා/ප්‍ර/01/01/2024 (61) හා 2024.07.05 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අවශ්‍ය කටයුතු සඳහා එම ලිපිය ඔබගේ අවධානයට ලක් කරන ලෙස මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 ඔක්තෝබර් මස 08 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

(05)

05 JUL 2024
/21
අධිකරණ අමාත්‍යාංශය
ශාඛාව 12.

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல. 462/2, கடுவெல வீதி, கணேஹென, பத்தரமுல்ல.
No: 462/2, Kaduwela Road, Ganahena, Battaramulla.

RECEIVED
10 JUL 2024
දිනය / Date
Prison Affairs
Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

මගේ අංකය / எனது இல / My No: පුනකා/පු/01/01/2024 (61)
ඔබේ අංකය / உமது இல / Your No:

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ලේකම් තුමණි,

<u>කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම.</u>

යොමුව:
අ. පුනකා/පු/01/01/2023(141) හා 2023.06.14 දිනැති මෙම කාර්යාංශ ලිපිය.
ආ. SMPRPR/PRI/05/පුන.කො.කාන්තා පුනරුත්ථාපන හා 2023.06.20 දිනැති ඔබ අමාත්‍යාංශ ලිපිය.

1. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර යහපත් පුද්ගලයන් වශයෙන් සමාජගත කිරීම මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය කන්දකාඩු, නවෝදාව තාක්ෂණික හා වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය සේනපුර සහ ඒකාබද්ධතා මධ්‍යස්ථානය වව්නියාව යන මධ්‍යස්ථාන මෙම කාර්යාංශය යටතේ මේ වන විට ක්‍රියාත්මක වනු ඇත.

2. එම මධ්‍යස්ථාන අතුරින් වව්නියාව ඒකාබද්ධතා මධ්‍යස්ථානය අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ කාන්තාවන් පුනරුත්ථාපන කිරීමට යොදා ගැනීම සඳහා යොමුගත "අ" දරණ ලිපිය මගින් කරන ලද ඉල්ලීමට යොමුගත "ආ" දරණ ඔබ අමාත්‍යාංශ ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇත.

3. එම අනුමැතිය ප්‍රකාරව කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් සඳහා වන යටිතල පහසුකම් ඇතුළු මූලික අවශ්‍යතා මේ වන විට මෙම මධ්‍යස්ථානය තුළ අවසන් කර ඇති බැවින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ කාන්තාවන්ගේ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීමේ හැකියාවක් පවතින බැව් දන්වා සිටිමි. තවද ප්‍රථම අදියර වශයෙන් කාන්තා රැඳවියන් 100 දෙනෙකු සඳහා පුනරුත්ථාපන පහසුකම් සැලසිය හැකි බවද කාරුණිකව දන්වමි.

4. කරුණු එසේ හෙයින් අධිකරණ නියෝග යටතේ පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි කාන්තාවන් මෙම මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්එස්පී ඩබ්එස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ළ්
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත -
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය

සාමාන්‍ය / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.bcgr.gov.lk

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2, Kaduwela Road, Ganahena, Battaramulla.

Adsu/Ad
Adsu/Pr
PR/05

RECEIVED 15 JUN 2023
RECEIVED 14 JUN 2023 Postal Section Ministry of Justice

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | පුනකා/ප්‍ර/01/01/2023 ( 141 ) | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.06.14 |

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගරු ලේකම් තුමියණි,

<u>පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා කාන්තා පුනරුත්ථාපනාලභීන් ඇතුළත් කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.</u>

යොමුව:

අ. 2021.03.24 දිනැති ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය.

ආ. අංක SLS.24 හා 12/2012 දරණ 2023.06.05 දිනැති ලිපිය අනුව 2023.06.08 දින නාවික හමුදා මූලස්ථානයේ පැවති විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකා සාකච්ඡාව.

1. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර යහපත් පුද්ගලයන් වශයෙන් සමාජගත කිරීම මෙම කාර්යාංශය මගින් සිදු කරනු ලබන අතර ඒ සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු, තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය සේනපුර සහ ඒකාබද්ධතා මධ්‍යස්ථානය වව්නියාව මේ වන විට කටයුතු කරනු ලබයි.

2. ඒ අනුව නොමග ගිය සටන්කරුවන් පුනරුත්ථාපනය සිදු කරනු ලැබූ වව්නියාව ඒකාබද්ධතා මධ්‍යස්ථානය යොමුව "අ" දරණ ගැසට් පත්‍රයට අනුව දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් වශයෙන් නම් කරනු ලැබුව ද මේ වන තෙක් එම ක්‍රියාවලිය ආරම්භ නොකරන ලද බැවින් දැනට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සිදු කරනු ලබයි.

3. නාවික හමුදා මූලස්ථානයේ පැවති විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකා (යොමුව "ආ" දරණ) සාකච්ඡාවේ දී දැනට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ කාන්තාවන් 83 දෙනෙකු පමණ සිටින බැවින් ඔවුන් පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීම පිළිබඳව සාකච්ඡාවට භාජනය වන ලද අතර එහිදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙතින් අදාළ කාන්තාවන් පුනරුත්ථාපනයට යොමු කිරීමට හැකියාවක් නොමැති බව සඳහන් කරන ලදී. එබැවින් එම කාන්තාවන් මෙම කාර්යාංශය යටතේ පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීමට කටයුතු කළ හැකිද යන්න විමසා සිටින ලද අතර ඒ පිළිබඳ සොයා බලා දන්වන ලෙස ඉල්ලීමක් කරන ලදී.

4. ඒ අනුව ඒකාබද්ධතා මධ්‍යස්ථානය වව්නියාවෙහි පුනරුත්ථාපනය වනු ලබන මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුනරුත්ථාපනලාභීන් තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය නව සේනපුර වෙත යොමු කර එම මධ්‍යස්ථානයේ මාස 06 ක පුනරුත්ථාපන කාල සීමාවක් සඳහා කාන්තා පුනරුත්ථාපනලාභිනියන් ඇතුළත් කිරීම සඳහා අවැසි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

5. තවද කාන්තාවන් පුනරුත්ථාපනය සඳහා ඔබ අමාත්‍යාංශ අනුමැතිය ලදහොත් ඒ සඳහා අවැසි මූලික අවශ්‍යතාවයන් මෙන්ම කාන්තා උපදේශකයින් හා උපදේශනය සඳහා සුදුසු අයවළුන් ලබා ගැනීම, ඔවුන් වෙනුවෙන් අවශ්‍ය ආරක්ෂාව සැපයීම, පුනරුත්ථාපන වැඩසටහන් පැවැත්වීම, සෞඛ්‍යය කටයුතු සඳහා අවශ්‍ය අයවළුන්ගේ සම්පත් දායකත්වය ලබා ගැනීම වැනි අවශ්‍යතා සඳහා ඉහත සඳහන් කළ කාර්ය සාධක බලකායේ සහයෝගය ලබා දෙන බව දන්වා ඇති අතර ඊට අමතරව වෙනත් අදාළ ආයතන සමග සම්බන්ධතාවයෙන් සහ ප්‍රාදේශීය වශයෙන් දෛනික ගෙවීමේ පදනම මත සම්පත් දායකයින් ලබා ගැනීමට අවැසි කටයුතු සිදු කළ හැකි බවද කාරුණිකව දන්වමි.

6. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී තම ජීවිත නාස්ති කර ගන්නා කාන්තා තරුණ කොටස් නිසි මගට යොමු කර සමාජයටත් රටටත් වැඩදායී පුද්ගලයින් බවට පත් කිරීමේ ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමියගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ජ්
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත් :
1. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2393/10 - 2024 ජූලි මස 15 වැනි සඳුදා - 2024.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 12/2008

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත

2 වන වගන්තිය යටතේ වන නියමය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මා විසින්, අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නිර්දේශය මත, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානය ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථානයක් වශයෙන් නම් කරනු ලැබේ.

ටිරාන් අලස්,
මහජන ආරක්ෂක අමාත්‍ය.

2024 ක් වූ ජූලි මස 12 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථානය

සාරංගා මධ්‍යස්ථානය

EOG 07 -0143


IA - G 42250 — 05 (2024/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.